**ජනාධිපතිවරයාගේ අරමුදල - 2021**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**--------**

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (i) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත 3 වන වගන්තිය | 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල පනතේ 3 වගන්තිය ප්‍රකාරව, පාලක මණ්ඩලයක් පැවතිය යුතු අතර, මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද, ඒ රැස්වීම්වල කටයුතු ද මණ්ඩලය විසින් විධිමත් කරගනු ලැබිය හැකි බව දක්වා තිබුණි. එසේවුවද, ජනාධිපතිවරයාගේ අරමුදලේ පාලක මණ්ඩල රැස්වීම 2019 ඔක්තෝබර් 18 දින අවසන් වරට පවත්වා තිබූ අතර, එදිනෙන් පසුව විගණිත දිනය වූ 2022 අගෝස්තු 31 දින දක්වා රැස්වීම් පවත්වා නොතිබුණි. | 2019.12.17 දින පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීමට සූදානම් කර තිබූ නමුත් එය දින නියමයක් නොමැතිව කල් තබන ලදි. නැවතත් පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීමට අදාළව අතිගරු ජනාධිපතිතුමාගෙන් අවස්ථා කිහිපයකදී දිනයක් හා වේලාවක් ලබා ගැනීමට උත්සාහ කළ ද, රටේ පැවති කොවිඩ් වාතාවරණය යටතේ ඒ සඳහා අවස්ථාව නොලැබී තිබුණි. | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| | (ii) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත 6 වන වගන්තිය | 6 වන වගන්තිය ප්‍රකාරව අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව යොදවනු ලැබිය හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,403,094,031 ක් වූ ගෙවීම් සඳහා විගණිත දිනය වූ 2022 අගෝස්තු 31 දින වන විටත් මණ්ඩලය විසින් නිශ්චය කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය යටතේ පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් නියම කිරීම අපහසු වී තිබුණි. | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 372 | ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ පවත්වාගෙන යන රු.මිලියන 6 ක අග්‍රිම ශේෂය 2022 අගෝස්තු 31 දින වන විටත් එම කාර්යාලය විසින් තහවුරු කර නොතිබුණි. | දකුණු ඉන්දියාවේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය සඳහා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් 2022 ඔක්තෝබර් 11 දිනැති ලිපිය මඟින් අග්‍රිම ශේෂය තහවුරු කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2018 ජූලි 26 දිනැති අංක 3/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් අරමුදල් රැස් කිරීම සහ ගෙවීම සිදු කිරීම වැනි විශේෂ අවස්ථාවන්හි දී භාවිතා කිරීම සඳහා අරමුදල මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 51204 (46078) දරන ජංගම ගිණුම 2019 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයේ පවතින අතර, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එම ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් අරමුදල් රැස් කිරීම සහ ගෙවීම් සිදු කිරීම වැනි විශේෂ අවස්ථාවන්හි දී භාවිත කිරීම සඳහා 51204 අංක දරන ගිණුම පවත්වාගෙන යනු ලබයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,708,287,273 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,338,345,661 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 369,941,612 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම් අඩුවීම රු. 496,100,986 ක් හෙවත් සියයට 26 ක් වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවස්ථා 47 ක දී වෛද්‍යාධාර ඉල්ලුම්පත් ලැබී මාස 09 ක සිට වර්ෂ 03 මාස 09 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.7,792,730 ක් වූ වෛද්‍යාධාර ඉල්ලුම්පත් සඳහා ගෙවීම් කර තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලය කැඳවීම හා ලිපිලේඛන යැවීම සහ ලැබීම අඩපණවී තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පෞද්ගලික රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් අවස්ථා 31 ක දී එකතුව රු.2,015,300 ක් වූ අයදුම්පත් ලැබී වර්ෂ 02 ක සිට වර්ෂ 04 මාස 08 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර ගෙවීම් කර තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රෝහලට කුවිතාන්සි නැවත යවා තොරතුරු සනාථ කර ගැනීමට සිදුවීම සහ ලිපිලේඛන යැවීම හා ලැබීම අඩපණ වී තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට රෝගීන් 15 දෙනෙකු වෙත වෛද්‍යාධාර ගෙවීම අනුමත කර තිබුණු අතර, රෝගින් විසින් ඒ සඳහා වෛද්‍ය බිල්පත් ද ඉදිරිපත් කර තිබුණි. රෝගීන් විසින් ඉදිරිපත් කර තිබුණු බැංකු ගිණුම් අංක ඇතුළත් විස්තර ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති විස්තර සමඟ නොගැලැපීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි. | මේ වන විට අදාළ වෛද්‍යාධාර ගෙවීමේ කටයුතු යථාවත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කළ යුතු වීම. |
| (ඇ) | සුභසාධන කාර්යයන් යටතේ කරුණාසහගත දීමනා ගෙවීම සඳහා හඳුනාගතහැකි නිශ්චිත නිර්ණායක අරමුදල මගින් හඳුන්වා දී නොතිබුණ අතර, අනුමත වෛද්‍යාධාර ලබාදීමේ ක්‍රමයෙන් බැහැරව ප්‍රතිලාභීන් 07 දෙනෙකු සඳහා විවිධ රෝග සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් කරුණාසහගත දීමනා ලෙස එකතුව රු.5,500,075 ක් අරමුදල විසින් වැය කර තිබුණි. මෙම කරුණාසහගත දීමනා ලෙස එකතුව තුළ ජනාධිපතිවරයාගේ විධානය රහිතව ප්‍රතිලාභීන් 03 දෙනෙකු වෙත එකතුව රු.2,393,909 ක වෛද්‍ය බිල්පත් ගෙවා තිබුණි. | 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 06(ඉ) හි සඳහන් පරිදි, අතිගරු ජනාධිපතිතුමාගේ අභිමතය පරිදි මුදල් ගෙවීම් සිදු කර තිබුණි. | වියදම් ගෙවීම් සඳහා ජනාධිපතිවරයාගේ විධානය ලබා ගත යුතු වීම. |
| (ඉ) | ආගමික, සංස්කෘතික කටයුතු හා අඩු ආදායම්ලාභී පවුල්වල අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් ලබා දෙන ශිෂ්‍යත්ව ප්‍රදානය හා විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ගෙවීමක් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පෙරහැර ආදී සංස්කෘතික උත්සව නොපැවැත්වීම හා පාසල් කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා අධ්‍යාපන හා විශේෂ ව්‍යාපෘති සාමාන්‍ය පරිදි සිදු කිරීමට නොහැකි විය. | අරමුදලේ අරමුණු ඉටු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පනතේ අරමුණු ඉටු වන අයුරින් අරමුදලින් මුදල් යොදවනු ලැබිය හැකි කාර්යයන් පිළිබඳ සමාලෝචිත වර්ෂය සඳහා භෞතික හා මූල්‍ය තොරතුරු ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව, අරමුදල විසින් රු.මිලියන 08 ක් වැයවන ක්‍රියාකාරකම් 02 ක් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණ ද, 2022 ඔක්තෝබර් 06 දින වන විටත් එම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | රටේ පැවති කොවිඩ් වාතාවරණය යටතේ සීමිත පිරිසක් චක්‍රීය වශයෙන් සේවයට කැඳවූ බැවින්, නව මිලදී ගැනීම් සිදු නොවූ අතර, නව සංකල්ප හඳුන්වා දී ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා එකතුව රු.මිලියන 139.16 ක් වැය කර තිබුණ අතර, ඉකුත් වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 473.17 ක් වැයකර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී අරමුදල් උපයෝජනය රු. මිලියන 334 කින් හෙවත් සියයට 71 කින් අඩු වී තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලය කැඳවීම හා ලිපිලේඛන යැවීම සහ ලැබීම අඩපණ වී තිබීම මෙම තත්ත්වයට හේතු විය. | අරමුදල වෙත ලැබෙන වෛද්‍යාධාර ඉල්ලීම් සඳහා අප්‍රමාදව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම්, පිළිකා රෝග, මොළය ආශ්‍රිත රෝග, දණහිස් හා උකුළ ආශ්‍රිත රෝග, වකුගඩු රෝග සහ වෙනත් ප්‍රතිකාර සඳහා රෝගීන් 6214 දෙනෙකු වෛද්‍යාධාර සඳහා ඉල්ලීම් කර තිබුණු නමුත්, රෝගීන් 1322 දෙනෙකු සඳහා පමණක් වෛද්‍යාධාර ගෙවීම් කර තිබුණි. ඉකුත් වර්ෂයේදී මෙවැනි රෝග සඳහා වෛද්‍යාධාර වශයෙන් රෝගීන් 1684 දෙනෙකු සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව 362 කින් හෙවත් සියයට 21 කින් අඩු වී තිබුණු අතර, 2019 වර්ෂය හා සැසඳීමේදී වෛද්‍යාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව 5,064 කින් හෙවත් සියයට 79 කින් අඩුවී තිබුණි. | - එම - | - එම - |